# දැන්වීමයි

## පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාව

## 2025 වර්ෂයට සභාව සතු පොදු වෙළඳපොළ අංක 14 දරණ මාළු කඩය බදු දීම සඳහා ටෙන්ඩර් කැඳවීම

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු වත්කම් 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා බදු දීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

- ටෙන්ඩර් ආකෘතිපත් නිකුත් කිරිම ආරම්භ වන දිනය හා වේලාව -2024.12.17 දින පෙ.ව.10.00 සිට
- ටෙන්ඩර් ආකෘතිපත් නිකුත් කිරිම අවසන් කරනු ලබන දිනය හා වේලාව - 2025.01.08 දින මධ්‍යහන 12.00 දක්වා
- ටෙන්ඩර් භාර දීමේ අවසාන දිනය හා වේලාව - 2025.01.08 දින ප.ව 1.00 දක්වා
- ටෙන්ඩර් විවෘත කිරීම - 2025.01.08 දින ප.ව.2.00 ට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී

ටෙන්ඩර් පෝරම නිකුත් කිරිමේදී මුද්දර බද්ද හා ජාතිය ගොඩනැගිමේ බද්ද අය නොකෙරේ. මෙයට අමතරව රජය විසින් වරින්වර පනවන බදු අය කිරීමට සිදු වේ. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේදී ඉල්ලුම් කරන ටෙන්ඩර් මුදලට මුද්දර හා ජාතිය ගොඩනැංවීමේ බද්ද ඇතුළත් නොකළ යුතුය. එක් ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ල හෝ ප්‍රතික්ෂේප කිරිමේ බලය පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාව සතුය.

වැඩිදුර තොරතුරු කාර්යාලීය දිනයන් වලදී පෙ.ව 9.00 සිට ප.ව 3.30 දක්වා 045-2274375 දුරකතන අංකයට ඇමතීමෙන් ලබාගත හැකිය.

| ස්ථානය | වෙළඳාමේ ස්වභාවය | පෝරම් ගාස්තු | ටෙන්ඩර් ඇප මුදල | ගිවිසුම් ඇප මුදල | වාර්ෂික අවම ලංසුව |
|---|---|---|---|---|---|
| පැල්මඩුල්ල පොදු වෙළඳපොළ | මාළු කඩය (අංක 14 කඩ කාමරය) | රු.3,000.00 | රු. 100,000.00 | හය මසක කුලියට සමාන මුදලක් | රු. 300,000.00 |

..............................................

ආර්.කේ.කපිල ජගත් ගුණතිලක,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ
ලේකම් හා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ
කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව,
පැල්මඩුල්ල.

# ලංසු කැඳවීමේ නිවේදනය

# පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

**2025 වර්ෂයට සභාව සතු පොදු වෙළඳපොළ අංක** 14 **දරණ මාළු කඩය බදු දීම සඳහා ලංසු කැඳවීම**.

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු පොදු වෙළඳපොළ අංක 14 දරණ මාළු කඩය හා අංක 13 දරණ කඩ කාමරය 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා බදු දීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් 2024.12.17 දින පෙ.ව.10.00 සිට 2025.01.08 දින ප.ව.1.00 දක්වා මා විසින් භාර ගනු ලැබේ.

02. 2024.12.17 දින පෙ.ව.10.00 සිට 2025.01.08 දින මධ්‍යහන 12.00 දක්වා සතියේ වැඩකරන දිනවල කාර්යාලීය වේලාව තුළ දී පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයෙන් පොදු වෙළඳපොළ මාළු කඩය හා අංක 13 දරණ කඩ කාමරය සඳහා ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

- ටෙන්ඩර් පෝරම පිටපත් දෙකකින් නිකුත් කරන අතර, එම ටෙන්ඩර් පෝරම සම්පූර්ණකර කවර දෙකක බහා වම්පස ඉහළ කෙළවරේ "පළමු පිටපත" හා "දෙවන පිටපත" යනුවෙන් ද වෙන්වෙන්ව සඳහන්කර එම කවර දෙකම වෙනත් කවරයක බහා වම්පස කෙළවරේ ටෙන්ඩරයේ නම සඳහන් කර "**ලේකම්**, **පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව**, **රිල්හේන**, **පැල්මඩුල්ල**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් **2025.01.08වන ප.ව.1.00** ට පෙර ලැබෙන සේ එවිය යුතුය.
- ටෙන්ඩර් අතින් භාර දීමට කැමති අය එම පිටපත් දෙක ඉහත ආකාරයට සකස් කර ප්‍රධාන කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය.

03. ටෙන්ඩර් විවෘත කිරීම.
2025.01.08. දින ප.ව.1.00 ට ටෙන්ඩර් පෙට්ටිය සීල් තබන අතර නියමිත වේලාවට පසු ඉදිරිපත් කරන හෝ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. 2025.01.08 දින ප.ව.2.00 ට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලය ඉදිරියේ දී ටෙන්ඩරය විවෘත කරනු ලැබේ. එකී වේලාවට ටෙන්ඩරය ඉදිරිපත් කළ අයට හෝ ඔහු විසින් ලිපියකින් බලය පැවරූ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගී විය හැක. තවද එක් ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ල හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව සතුය.

04. වැඩිදුර තොරතුරු කාර්යාලීය දිනයන් වලදී පෙ.ව 9.00 සිට ප.ව 3.30 දක්වා 045-2274375 දුරකතන අංකයට ඇමතීමෙන් ලබාගත හැකිය.

**උපලේඛනය අංක** 01

| **අනු අංකය** | **ස්ථානය** | **වෙළඳාමේ ස්වභාවය** | **පෝරම ගාස්තු** | **ටෙන්ඩර් ඇප මුදල** | **ගිවිසුම් ඇප මුදල** | **වාර්ෂික අවම ලංසුව** |
|---|---|---|---|---|---|---|
| 01 | පැල්මඩුල්ල පොදු වෙළඳපොළ | මාළු කඩය (අංක 14 කඩ කාමරය) | රු.3,000.00 | රු 100,000.00 | හය මසක කුලියට සමාන මුදලක් | රු. 300,000.00 |

**ආර්.කේ.කපිල ජගත් ගුණතිලක,**
**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් හා**
**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ**
**කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,**
**ප්‍රදේශීය සභාව,**
**පැල්මඩුල්ල.**

(ටෙන්ඩර් අයදුම් පත්‍රය සමඟ මෙය අත්සන් කර ඉදිරිපත් කළ යුතුය.)

## පැල්මඩුල්ල පොදු වෙළඳපොළ අංක 14 දරණ මාළු කඩය ටෙන්ඩර් කැඳවීමට විස්තර හා ටෙන්ඩර් කොන්දේසි

1. 2025 ජනවාරි මස 08 වන දින මධ්‍යහන 12.00 ට ප්‍රථම උපලේඛණයේ පරිදි මෙම කාර්යාලයට නියමිත ගාස්තු ගෙවා ටෙන්ඩර් පෝරම ලබා ගත හැක. මෙකී ගාස්තු මුදලින් ගෙවිය යුතු අතර චෙක්පත් භාර ගනු නොලැබේ.

2. ටෙන්ඩර් පෝරම පිටපත් දෙකකින් නිකුත් කරන අතර, එම ටෙන්ඩර් පෝරම සම්පූර්ණකර කවර දෙකක බහා වම්පස ඉහළ කෙළවරේ "**පළමු පිටපත**" හා "**දෙවන පිටපත**" යනුවෙන් වෙන්වෙන්ව සඳහන්කර එම කවර දෙකම වෙනත් කවරයක බහා වම්පස කෙළවරේ ටෙන්ඩරයේ නම සඳහන්කර "**ලේකම්**, **පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව**, **රිල්හේන**, **පැල්මඩුල්ල**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2025.01. 08 **දින ප.ව.**1.00 **ට පෙර ලැබෙන සේ** එවිය යුතුය. ටෙන්ඩර් අතින් භාර දීමට කැමති අය එම පිටපත් දෙක ඉහත ආකාරයට සකස්කර ප්‍රධාන කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය.

3. බදුකරු විසින් ඉල්ලුම් කරන මුදල සමාන වාරික 12 කින් ගෙවිය යුතු අතර වාරික 06 කට සමාන මුදලක් සභාවේ තැන්පත් කර ගිවිසුම් පත්‍රයක් අත්සන් කළ යුතුය. එසේ තැන්පත් කරන මුදල ආපසු ගෙවනු ලබන්නේ නියමිත වාරික 12 ගෙවා අවසන් කිරීමෙන් අනතුරුවය.

4. 2025.01.08 දින ප.ව.1.00 ට ටෙන්ඩර් පෙට්ටිය සීල් තබන අතර නියමිත වේලාවට පසු ඉදිරිපත් කරන හෝ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. 2025.01.08 **දින ප.ව.**2.00 ට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලය ඉදිරියේ දී ටෙන්ඩරය විවෘත කරනු ලැබේ. එකී වේලාවට ටෙන්ඩරය ඉදිරිපත් කළ අයට හෝ ඔහු විසින් ලිපියකින් බලය පැවරූ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගී විය හැක.

6. මෙම දැන්වීමට අදාල ටෙන්ඩරය හෝ සියළුම ටෙන්ඩර් නොදන්වා ප්‍රතික්ෂේප කිරීමේ බලය පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු වන අතර, මේ සම්බන්ධයෙන් සභාව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

7. බදුකරු විසින් ඉල්ලුම් කරනු ලබන මුදල සඳහා මුද්දර බදු හා රජයේ බදු මුදල් ගෙවිය යුතුය. අමුණා ඇති උපලේඛණයේ අවම ලංසුව තීරණය කර ඇත්තේ මුද්දර බද්ද සහ රජයේ බදු මුදල් රහිතවයි.

8. මෙයට අදාල සියළුම විස්තර සතියේ දිනයන්හි දී කාර්යාල වේලාවන් තුළදී පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවෙන් විමසා දැනගත හැක. (දුරකතන අංකය- 045-2274375)

9. මෙම ලංසුවට අඩුවෙන් මිල ගණන් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත් අවලංගු කරනු ලබන අතර, තැන්පත් මුදල ආපසු ගෙවනු නොලැබේ.

10. කඩ කාමරය ටෙන්ඩර් ලබා ගැනීමෙන් පසු ලැබෙන ජල සහ විදුලි බිල්පත් ටෙන්ඩර්කරු විසින් දැරිය යුතුය.

11. ටෙන්ඩර්කරු සමග එළඹෙන ගිවිසුම අනුව නියමිත දිනට මුදල් ගෙවිය යුතු අතර , ප්‍රමාද වුවහොත් වාරික මුදල අතපසු වන සෑම මසකටම වෙන වෙනම 10% ක දඩ මුදලක් සභාවට ගෙවිය යුතුය.

12. ටෙන්ඩර් පත් වල යම් වෙනසක් කරන්නේ නම් ටෙන්ඩර්කරු එයට තම කෙටි අත්සන යෙදිය යුතුය.

13. පෙර වර්ෂවල ටෙන්ඩර් ලබා ගත් අසාර්ථක ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර්පත් නිකුත් කරනු නොලැබේ.

14. ටෙන්ඩර් විවෘත කිරීමේදි උපරිම මිල ගණන් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩරය ලබා දීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කළහොත් දින 07 ක් ඇතුළත ඇප මුදල් තැන්පත් කර ගිවිසුම් අත්සන් කල යුතුය. එසේ නොකළහොත් එම ටෙන්ඩර්කරුගේ ටෙන්ඩර් තැන්පත් මුදල සභාව සතු කරනු ලැබේ.

15. ටෙන්ඩර් විවෘත කිරීමේදී උපරිම මිල ගණන් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්කරු ටෙන්ඩරය ලබා ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල් සභාව සතු කර ඔහු අසාදුලේඛණ ගත කරනු ලබන අතර, ඊළඟට මිල ගණන් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩරය ලබා දීමට කටයුතු කරනු ලැබේ.

16. තම බදු කාලය තුළදී බදුකරු විසින් තමන් බද්දට ගත් කඩ කාමරය හෝ ඉන් කොටසක් හෝ අතුරු බද්දක් දීම හෝ උකස් කිරීම හෝ එකී භුක්තිය අන් අයෙකුට කිසිම අයුරකින් පැවරීම හෝ කඩ කාමරයේ වෙන් කිරීම හෝ බලය අවලංගු කිරීමටත් කඩ කාමරයේ බදු ගිවිසුම අවලංගු කර කඩ කාමරය ආපසු ලබා ගැනීමටත් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති/ලේකම් වෙත බලය රඳවාගනු ලැබේ. ඒ සඳහා වන්දියක් ඉල්ලීමට බදු කරුට අයිතියක් නොමැත.

17. පිළිගත් ටෙන්ඩර්කරු විසින් තමා විසින් බදු ගන්නා ලද කඩ කාමරය බද්ද අවසානයේ දීම එනම් 2025-12-31 වන දින කඩ කාමරයෙන් අස් වී පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති/ලේකම් හෝ ඔහුගේ නිල කාලයෙන් පසු බලයට පත් වන අයෙකුට හෝ ඔහු විසින් ලියවිල්ලක් බලය පවරන නිලධාරියෙකුට භාරදිය යුතුය.

18. පිළිගත් ටෙන්ඩර්කරු විසින් බදු ගෙන ඇති කඩ කාමරය බදුලත් කාර්යය සඳහා හැර වෙනත් කිසිම කාර්යයක් සඳහා පරිහරණය නොකළ යුතුය.

19. බද්දට ගන්නා ලද කඩ කාමරයේ බලපත්‍රකරු විසින් වසරකට සිව්වරක්වත් එනම් මාස තුනකට වරක්වත් කඩ කාමරයේ බිත්තිවල පිහන් ගඩොල් අල්ලා ඇති කොටසේ හැර සෙසු සියළුම ප්‍රදේශවල තීන්ත ගෑමද කළ යුතු අතර, කඩ කාමරය පිරිසිදුව තබා ගත යුතුය.

20. විශේෂ අවස්ථාවකදී හෝ බලයලත් කාර්යයකදී කඩ කාමරය පවරා ගැනීමට අවශ්‍යතාවයක් උද්ගතවුවහොත් මසක කල් දීමකින් අනතුරුව කඩ කාමරය පවරා ගැනීමේ අයිතිය ප්‍රාදේශීය සභාව සතුය.

21. ජාතික වශයෙන් හෝ ආගමික වශයෙන් වැදගත්කමක් ඇත්තාවූ දින සහ ප්‍රාදේශීය සභාව තහනම් කර ඇති දිනවල කඩ කාමරය වසා තබන ලෙස කඩ කාමරය බදු ගත් තැනැත්තාට නියම කිරීමට මෙම සභාවට බලය තිබේ. එවැනි අවස්ථාවකදී කඩ කාමර කුලිය අඩු කරන ලෙස ඉල්ලා සිටීම හෝ වන්දියක් ඉල්ලා සිටීමට හෝ ඒ කඩ කාමර බදු කරුට අයිතිවාසිකමක් නැත.

22. කඩ කාමරය පෙරවරු හතේ සිට (පෙ.ව.7.00) පස්වරු අට (ප.ව.8.00) දක්වා මහජනයා සඳහා විවෘතව තැබිය යුතුය.

23. පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති/ලේකම්ගේ ලිඛිත අවසරයක් නොමැතිව කඩ කාමරය ලිත් මාසයක් තුළ එක්වර දින තුනකට වඩා දීර්ඝ කාලයක් වසා නොතැබිය යුතුය.

24. කඩ කාමරයක දුනු තරාදි (ස්ප්‍රිනියන් ස්කේල්) පාවිච්චි නොකළ යුතු අතර, ඒ සඳහා විද්‍යුත් තරාදි (Electronic scale) භාවිතා කිරීම අනිවාර්ය වන අතර, ඒවා ගැනුම්කරුවන්ට පැහැදිලිව පෙනෙන සේ තැබිය යුතුය.

25. කඩ කාමරයෙන් අස්වන යම් දිනක කඩ කාමරයේ සවි කර ඇති උපකරණ යථා තත්ත්වයෙන් ආපසු භාර දිය යුතු අතර, යම් අලාභ හානියක් සිදුවී ඇතිනම් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති/ලේකම් තැන විසින් කරනු ලබන තක්සේරුව අනුව ගෙවිය යුතු වන්දි මුදල් ආදිය පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතුය.

26. කඩ කාමරය තුළ ඇති වෙළඳ භාණ්ඩවලට සිදුවන කිසිදු අලාභහානියක් සම්බන්ධව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව වග කියනු නොලැබේ.

27. බදුකරු විසින් බදු ගනු ලැබූ කඩ කාමරය නියමිත බදු කාලය අවසන් නොවී ආපසු භාර දෙන්නේ නම් ලිත් මාසයක කල්දීමෙන් පසුව එසේ කළ හැකිය. එමෙන්ම මාසයක කඩකුලිය ද සභාවට ගෙවිය යුතුය.

28. නොකඩවා මාස 2ක් කඩ කුලී නොගෙවුවහොත් පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ අංක 03/2020 අනුව තෙවන මාසය ඉක්මයාමට පෙර කඩ කාමරය ප්‍රාදේශීය සභාවට පවරාගනු ලබන අතර ඒ සම්බන්ධයෙන් වන සියළුම අලාභහානි බදුකරු විසින් දැරිය යුතුය.

29. බදුකරු විසින් කිසියම් වාරිකයක් ගෙවීම සිදු නොකිරීම, ගෙවීම් ප්‍රමාද කිරීම, කිසිසේත්ම සිදු නොකල යුතු අතර එසේ කරනු ලබන පැහැර හැරීමකදී අධිකරණ ක්‍රියාමාර්ග වලට එළඹීමට සම්පූර්ණ බලය බදු දීමනාකාර පාර්ශවය සතුය.

30. ගෙවීම් පැහැර හැරීම මත අධිකරණමය කියාමාර්ග වලට එළඹීමේදී සභාව විසින් දරන්නට වන සියලුම ආකාරයේ වියදම් ගෙවිය යුතු හිඟ මුදලට අතිරේක වශයෙන් බදු දීමනාකාර පාර්ශවය වෙත පියවීමට බදු ගැනුම්කරු පොරොන්දුව බැඳී සිටී.

31. ඔබ විසින් පවත්වාගෙන යනු ලබන වෙළඳාම සම්බන්ධව ලබා ගත යුතු වෙනත් බලපත්‍ර ඇතොත් ඒවාද වාර්ෂික වෙළඳ බලපත්‍රය ද, ලබා ගැනීම අනිවාර්ය වේ.

32. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන කඩ කුලියට අමතරව රජයේ අනුමත බදු මුදල් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතුය.

33. කඩ කාමර ඇතුලතට ජල හෝ විදුලි සම්බන්ධතා අවශ්‍ය වේ නම් ඒ සඳහා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් අනුමැතිය යටතේ වෙනමම සැපයුම් ලබාගත හැකි අතර, ඒ සඳහා වන වියදම බදුකරු විසින් දැරිය යුතුය. දැනට ජල හෝ විදුලි සම්බන්ධතා සභාව විසින් ලබාගෙන තිබේ නම් එම බිල්පත් ටෙන්ඩර්කරු විසින් ගෙවිය යුතුය. තවද මාස දෙකකට ජල හෝ විදුලි සබඳතා නොගෙවා ඇත්නම් ටෙන්ඩර්කරුට නොදන්වා ගිවිසුම් ඇප මගින් අයකිරීමේ බලය සභාව සතු වන්නේ ය.

34. ටෙන්ඩර් අයදුම්පත්‍රයේ ඉල්ලුම්කරු විසින් සම්පූර්ණ කල යුතු ස්ථාන වල විකෘති කිරීමක්, වෙනස් කිරීමක් කරන ලද සියළුම ස්ථානවල ඉල්ලුම්කරුගේ කෙටි අත්සන යෙදීම අනිවාර්ය වේ.එසේම පැහැදිලිව ඉදිරිපත් නොකරන ටෙන්ඩර් අයදුම්පත් ද, ටෙන්ඩර් මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, එවැනි අවස්ථාවක දී ටෙන්ඩර් ඇප මුදල් සභාව සතු වන්නේ ය.

35. ටෙන්ඩර් අයදුම්පත් ලබාගෙන එය නියමිත දිනට වේලාව තුළ ඉදිරිපත් නොකරන ටෙන්ඩර්කරුවන්ගේ ද, ටෙන්ඩරය පිරිනැමීම සඳහා ටෙන්ඩර් මණ්ඩලය විසින් පිළිගත් සුදුසුකම් ලැබූ ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් අයදුම්පත්‍රයේ සඳහන් කාලය තුල ගිවිසුම් ඇප තැන්පත් මුදල් ගෙවීමට අපොහොසත් වන හා ගිවිසුම් අත්සන් කිරීමට අපොහොසත් වන ටෙන්ඩර්කරුවන්ගේ ද, ටෙන්ඩර් අයදුම්පත්‍රයේ සඳහන් කිසියම් විස්තරයක්, කොන්දේසියක් හෝ කිහිපයක් උල්ලංගනය කරනු ලබන ටෙන්ඩර්කර්වන්ගේ ද, ඇප මුදල් ආපසු ගෙවනු නොලැබේ.

ඉහත විස්තරය හා කොන්දේසි කියවා බලා තේරුම්ගෙන ඒ අනුව ක්‍රියා කිරීමට එකඟ වී මෙම ටෙන්ඩරය ඉල්ලන බව සහතික කරමි.

..................................................
ටෙන්ඩරුකරුගේ අත්සන

..................................................
දිනය

..................................................
(ජාතික හැඳුනුම්පත් අංකය)

# ලංසු අයදුම්පත්‍රය

## පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

පැල්මඩුල්ල පොදු වෙළඳපොළ අංක 14 මාළු කඩය 2025 ජනවාරි මස 01 දින සිට 2025 දෙසැම්බර් මස 31 දින දක්වා බදු දීම.

1. ටෙන්ඩර් පෝරමය නිකුත් කළ දිනය - ..........................................................................................
2. ටෙන්ඩර් පෝරමය නිකුත් කළ අයගේ නම - ..........................................................................................
3. ටෙන්ඩර් පෝරමය නිකුත් කළ අයගේ ලිපිනය - ..........................................................................................
4. හැඳුනුම්පත් අංකය - ..........................................................................................
5. වෙළඳාමේ ස්වාභාවය - මාළු කඩය
6. නියම කර ඇති වාර්ෂික අවම ලංසුව - රු.300,000.00
7. තැන්පත් මුදල ගෙවා ඇති ලදුපත් අංකය හා දිනය - ..............................................................................
8. නිකුත් කරන නිලධාරියාගේ අත්සන - ..............................................................................

ලේකම්,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව,

පැල්මඩුල්ල නගරයේ පොදු වෙළඳසැල අංක 14 දරණ මාළු කඩ කාමරය, 2025 ජනවාරි මස 01 දින සිට 2025 දෙසැම්බර් මස 31 වන දින දක්වා වෙළඳාම් කිරීමේ බලය ලබා ගැනීම සඳහා ........................................................................................................................ ලිපිනයේ පදිංචි ........................................................................................................... වන මම ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රු. ..................................................................................... ( ........................................... ) කට මෙයින් ඉල්ලුම් කරමි. (වරහන් තුළ මුදල ඉලක්කමෙන් ලියන්න)

එසේම පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් පනවා ඇති හා මතුවට පනවනු ලබන අතුරු ව්‍යවස්ථා හෝ රජය විසින් පනවා ඇති හා මතුවට පනවනු ලබන අණපනත් හා ඒ යටතේ ඇති රෙගුලාසි වලට අනුව කටයුතු කරන බවට ද මෙයින් පොරොන්දු වෙමි. ටෙන්ඩර් කොන්දේසි මාලාව මවිසින් කියවා අත්සන් කර මෙයට අමුණා ඇත.

තව ද පැල්මඩුල්ල නගරයේ පොදු වෙළඳසැලේ මාළු කඩ කාමර බදු දීම සම්බන්ධයෙන් පනවා ඇති සහ මතුවට පනවනු ලබන සියළුම කොන්දේසිවලට යටත්ව කටයුතු කිරිමට එකඟවෙමි.

දිනය ...................................

..........................................
ටෙන්ඩර්කරුගේ අත්සන